## ඇලහැර ප්‍රාදේශීය සභාව

1. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 ජූලි 31 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 01 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 ඔක්තෝබර් 22 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය.

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ඇලහැර ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් කරුනු නිරීක්ෂණය කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම් රු. 225,100 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) අවිනිශ්චිත ගිණුමේ වූ රු. 276,543 ක බැර ශේෂය හඳුනා ගැනීමකින් තොරව සමුච්චිත අරමුදලින් කපාහැර තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

2011 දෙසැම්බර් 31 වන විට විගණන විමසුම් 05 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම් වලට භාජනය වූ ගණුදෙනුවල ගණනය කළ හැකි වටිනාකම රු. 27,426,897 ක් විය.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 30.986,562 ක් වූ ගණුදෙනු

විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 3,640,819 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 610,737 ක් විය.

2.2 ආදායම් පරිපාලනය.

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට වූ සමුච්චිත හිගය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) | වරිපනම් හා බදු | 628 | 1,315 | 808 |
| (ii) | බදු කුලී | 1,564 | 1,839 | 758 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 90 | 90 | 48 |
| (iv) | වෙනත් ආදායම් | 6,196 | 10,303 | 2,162 |

2.2.2 උසාවි දඩ

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 2,657,889 |
| (ii) | මුද්දර ගාස්තු | 576,450 |

2.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්.

පහත විග්‍රහ කර ඇති පරිදි ඇතැම් වත්කම් නිෂ්ක්‍රීයව පැවැති බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

| වත්කම් විස්තරය | වටිනාකම | නිශ්ක්‍රීය වු දිනය | නිශ්ක්‍රීය කාල සීමාව |
|---|---|---|---|
| -------------------- | ------------ | ------------- | ------------- |
| | රු. | | |
| (i) සහල් පිටි සැකසුම් නිෂ්පාදන යන්ත්‍රය | 613,500 | 2008.04.17 | අවු.04 |
| (ii) සහල් පිටි නිශ්පාදන ගොඩනැගිල්ල | 493,675 | 2008.04.17 | අවු.04 |
| (iii) ජල බවුසරය | 50,000 | 2011 වර්ෂය | අවු.01 |
| (iv) යුධ හමුදාව විසින් ආපසු භාර දෙන ලද ඩබල් කැබ් රථය | ගණනය කර නැත | 2009.10.16 | අවු. 02 |

2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------

සභාවට පැවරි ඇති කාර්යයන්, ඉදිරි වර්ෂවලදී ඉටුකිරීමට සැලසුම් කර ඇති ආකාරය දැක්වෙන, සංයුක්ත සැලැස්මක්, හා සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාර් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

2.5 අභ්‍යන්තර විගණනය

-----------------------

සමාලෝචිත වර්ෂයේ ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3 පද්ධති හා පාලන

------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරනය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය